# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1914/41 - 2015 මැයි මස 15 වැනි සිකුරාදා - 2015.05.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

### මිණිපේ ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (iii) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මිණිපේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1)(අ) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම ගැසට් නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව මිණිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,<br>
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2015 පෙබරවාරි මස 19 වැනි දින,<br>
මහනුවර,<br>
මධ්‍යම පළාත් සභාවේ,<br>
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*මිණිපේ ප්‍රාදේශීය සභාව*

*බදු අයකර ගැනීම සඳහා තොරතුරු ලබාගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

1. මෙම අතුරු ව්‍යවස්ථාව මිණිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියළු ව්‍යාපාර, ස්ථාන හා කර්මාන්ත සම්බන්ධයෙන් බදු අයකර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

1A - PG 2464 — 106 (2015/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. මෙම අතුරු ව්‍යවස්ථාව මිණිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියළු ව්‍යාපාරික, ස්ථාන හා කර්මාන්ත සම්බන්ධයෙන් බදු අය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ගිණුම් වාර්තාවලට අදාල තොරතුරු ලබාගැනීමට අවශ්‍ය වාර වාර්තා ලබාගැනීමේ කටයුතු විධිමත් කිරීම සඳහා පනවනු ලැබේ.

3. මිණිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති සියළු ව්‍යාපාර, කර්මාන්ත හා සංවිධාන පිළිගත් ගිණුම් ක්‍රමයක් අනුව පැහැදිලි ගිණුම් වාර්තා පවත්වාගෙන යා යුතුය.

4. සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලැබූ නිළධාරියා විසින් ඉල්ලුම් කරනු ලබන සියළුම මූල්‍ය හා ගිණුම්වලට අදාළ තොරතුරු ලබාදීම පිටපත් ලබාදීම ව්‍යාපාර බද්දට යටත් තැනැත්තකුගේ කාර්යය වන්නේය.

5. සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් බලය පවරූ යම් නිළධාරියකු විසින් කළින් කල ඉල්ලා සිටිනු ලබන සියළුම ව්‍යාපාරික තොරතුරු හා මූල්‍ය ගිණුම් පිළිබඳ වාර වාර්තා පිළිගත් මූල්‍ය හා ගිණුම් සංකල්පය මත පිළියෙල කරනු ලබන ඒවා විය යුතුය.

6. ඉහත 05 වන අතුරු ව්‍යවස්ථාව මගින් ඉදිරිපත් කරන සියළුම මූල්‍ය හා ගිණුම් වාර්තා පිළිගත් ගිණුම් පරීක්ෂකයෙකු මගින් පරීක්ෂාවට ලක් කල සහතික කරන ලද වාර්තා විය යුතුය.

7. මිණිපේ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ බලය පැවරූ නිළධාරියා විසින් යවනු ලබන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තකු විසින් එකී දැන්වීම තමාට ලැබුණු දින සිට දින 14 ක් ඇතුලත එකී දැන්වීම මගින් ඉල්ලා ඇති තොරතුරු ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

8. අසත්‍ය තොරතුරු ලබාදීම හෝ තොරතුරු හෙළිදරවු නොකිරීම වරදක් වන්නේය.

9. ඉහත 5 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ඉල්ලා සිටිනු ලබන වාර වාර්තාවලට අදාල තොරතුරු පරීක්ෂා කිරීමට අවශ්‍ය වන්නේ නම් අදාළ ව්‍යාපාරික ස්ථානයට කර්මාන්ත පරිශ්‍රයට පැමිණ සභාපතිවරයාට හෝ බලය පැවරූ නිළධාරියාට එම පොත් වල සත්‍යතාවය පරීක්ෂා කිරීම නීත්‍යානුකුල වන්නේය.

10. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය පනතේ 122 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

11. 10 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කරන දඩ මුදල් ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලට බැර විය යුතුය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ

"සභාපති" යන්නෙන් මිණිපේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද.

"සභාව" යන්නෙන් මිණිපේ ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"බලයලත් නිලධාරි" යන්නෙන් මිණිපේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියාද අදහස් වේ.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

05 - 801

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.